**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව**
**මොණරාගල දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 ඔක්තෝබර් 27 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 17 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 නොවම්බර් 07 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට බඩල්කුඹුර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ද තක්සේරු කර ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදී අලුත්වැඩියා කටයුතු සඳහා රැගෙන ගොස් අස්ථානගත වී නැවත සමාලෝචිත වර්ෂයේදී සභාවට භාරදෙන ලද අංක රහිත ජල බවුසරයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු පුස්තකාල දෙකක පරිග්‍රහණ ලේඛන අනුව මිල සඳහන් නොකළ පොත් 61 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) 2006 වර්ෂයේ සිට පැවත එන රු. 83,719 ක් වු සභාවේ පෙර ගෙවුම් ශේෂය නිරවුල් කර ගැනිමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

1.3.2 **<u>නොසැසඳු පාලන ගිණුම්</u>**

ගිණුම් විෂයන් 08 කට අදාළව මූල්‍ය ප්‍රකාශණ අනුව ශේෂයන්ගේ එකතුව රු.42,610,791 ක් වූ අතර, ලේඛන අනුව ශේෂය රු.38,579,684 ක් විය.

1.3.3 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,360,472 ක් වූ වත්කම් විෂයන් 02 ක් හා රු.1,777,799 ක වගකීම් විෂයක් හා රු.19,889,163 ක ආදායම් විෂයක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 **<u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **<u>නීති,රීති රෙගුලාසි වලට යොමුව</u>** | **<u>අනුකූල නොවීම</u>** |
|---|---|
| (අ) **<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | |
| (i) 19 (1)(i) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් හා ජූලි මාසවලදී අනියම් ජලනල කම්කරුවෙකු හා පුස්තකාල භාරකරුවෙකු බඳවාගෙන රු.142,938 ක වැටුප් හා දීමනා සභා අරමුදලින් ගෙවා තිබුණද, පළාත්පාලන කොමසාරිස්වරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 158 හා 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.43,282,312 ක් වු හිග ආදායම් අයකර ගෙන නොතිබුණි. |

(ආ) **<u>1987 අංක 44 දරන ජාතික පාරිසරික පනත.</u>**

| | |
|---|---|
| 23 (අ) වගන්තිය | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත 12 කට වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි. |

1.3.5. <u>බලය නොලත් ගණුදෙනු</u>

(අ) සභාවේ අනියම් සෞඛ්‍ය කම්කරුවෙකු බඩල්කුඹුර ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා කාර්යාලයේ සේවය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් මාස සඳහා අනුමැතියකින් තොරව සභා අරමුදලින් රු. 32,236 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 2012 ජනවාරි 25 දිනැති අංක 12/ආ/06/අතිරේක ඉන්ධන ලිපිය ප්‍රකාරව සභාපතිවරයෙකුගේ මාසික ඉන්ධන සීමාව ලීටර් 300 ක් වූ අතර, එම ප්‍රමාණය ඉක්මවා පාවිච්චි කළ ඉන්ධන ලීටර් 200 ක් සඳහා මොනරාගල සහකාර කොමසාරිස්ගේ අනුමැතියද ඊට වඩා වැඩි වන ලීටර් ප්‍රමාණය සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියද ලබා ගත යුතු වුවත්, එසේ අනුමැතිය නොමැතිව රු.18,331 ක් වටිනා ඉන්ධන ලීටර් 151 ක් භාවිතා කර තිබුණි.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 154,709 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 719,031 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීම රු. 564,322 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>වරිපනම් බදු</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140(1) ප්‍රකාරව 2006 වර්ෂයෙන් පසු 2013 දෙසැම්බර් 12 දින දක්වා වරිපනම් බදු තක්සේරු කර නොතිබුණි

2.2.2 <u>බදුකුලී</u>

(අ) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2008 වර්ෂයේ ඉදිකරන ලද බඩල්කුඹුර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 16 ක් 2013 දෙසැම්බර් 12 දින දක්වා බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බඩල්කුඹුර ප්‍රාදේශීය සභා සතිපොලේ කඩ කාමර 03 ක් සමාලෝචිත වර්ෂයේදී බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බඩල්කුඹුර ප්‍රාදේශීය සභා සතිපොල කඩ කාමර 06 කින් රු.56,728 ක හිඟ මුදලක් අය කරගෙන නොතිබුණි.

(ඈ) බඩල්කුඹුර නගරයේ මාළු වෙළඳ සැල සමාලෝචිත වර්ෂය සඳහා බදු දීමට 2012 නොවැම්බර් 15 දින පැවති ප්‍රසම්පාදන කමිටුවේදී තීරණය කර 2013 ජනවාරි 28 වන දින රු. 138,889 ක ආරක්ෂිත ඇප තැන්පතු ලබාගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ ජුනි 07 දින වන විටත් සභාව ගිවිසුම් අත්සන් නොකර බදු කරුට මාළු කඩය පවත්වා ගෙන යාමට ඉඩහැර අදාල බදු කුලියද අයකර ගෙන නොතිබුණි.

(ඉ) බඩල්කුඹුර නගරයේ පිහිටි අංක 04 දරන එළහරක් මස් කඩය 2011 වර්ෂයේදී රු. 1,360,500 ට බදුගෙන තිබූ බදුකරු වෙත 2012 වර්ෂය සඳහා ශීතකළ එළහරක් මස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා රු. 3,300 ක වෙළඳ බලපත්‍රයක් මත බදු දී තිබුණි.

2012 වර්ෂයට බදු දීමේදි විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණි. මේ හේතුවෙන් 1,496,500 ක ආදායමක් සභාවට අහිමි වී ගොස් තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී මෙම එළහරක්මස් කඩය රු. 1,646,205 ක අවම ලංසුවකට බදු මුදල් තීරණය කර තිබුණද සභාව විසින් විධිමත් පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම නිසා සභාවට අයවිය යුතු ආදායම ද අහිමි වී ගොස් තිබුණි.

2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 156,849 |
| මුද්දර ගාස්තු | 807,593 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සභාවේ පුස්තකාල 04 කට අදාළව 2012 වර්ෂයේදී සමීක්ෂණයට ඉදිරිපත් නොවූ රු.28,622 ක් වටිනා පුස්තකාල පොත් 272 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) 2011 හා 2012 වර්ෂවලදී ලැබුණු රු.152,440 ක කර්මාන්ත තැන්පතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය